MEDIA RELEASE – 04 January 2011

# සියලුම ගනුදෙනුකරුවන්ට සෙලාන් බැංකුවෙන් ත්‍යාග

සෙලාන් බැංකුව නොබෝද සෙලාන් ෂුවර් (Seylan SURE) නමැති ප්‍රතිලාභ ක්‍රමය හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින දහස් ගණනක් සිය ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභ අත් වන පරිදි සිය ත්‍යාග පිරිනැමීමේ වැඩපිළිවෙළ තවත් ව්‍යාප්ත කළේය.

මෙම නමින් කියවෙන අරුත සනාථ කරමින් විශේෂයෙන් සැලසුම් කළ සෙලාන් ෂුවර් (Seylan SURE) ත්‍යාග ක්‍රමයෙන් අවම වශයෙන් රුපියල් 20,000 ක ශේෂයක් බැංකුවේ පවත්වා ගෙන යන සියළුම ජංගම හා සාමාන්‍ය ඉතුරුම් (තනි පුද්ගල හා හවුල්) ගිණුම් හිමි ගනුදෙනුකරුවන්ට ත්‍යාග සහ මුදල් හිමිකර ගැනීමට අවස්ථාව උදාවෙයි.

සෙලාන් ෂුවර් ක්‍රමයෙන් කෙනෙකුගේ ජීවිතයේ වැදගත් අවස්ථා හතරක් එනම් විවාහය, දරුවෙකුගේ උපත, ශල්‍ය කර්මයකට භාජනය වීම හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ උපන් දින පිළිබඳව අවධානය යොමු කරයි.

එවැනි සියළුම ගිණුම් හිමියන්ට විවාහයේ දී සහ දරුවෙකුගේ උපතේ දී විශේෂ මුදල් ත්‍යාගයක් පිරිනැමේ. මෙම වැඩපිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙන යමින් යම් කිසි ගිණුම් හිමියෙකු පෞද්ගලික හෝ රජයේ රෝහලක දී ශල්‍ය කර්මයකට භාජන කෙරුණු විට (ඇසේ සුද ඉවත් කිරීමේ සැත්කම් ද ඇතුළුව) ඔවුන්ට මුදල් ප්‍රදානයක්

පිරිනැමේ. ගිණුම් හිමියන්ගේ පවුලේ සමීපතම සාමාජිකයන්ට ද ප්‍රතිලාභ අත්වන පරිදි මෙම පහසුකම ව්‍යාප්ත කෙරේ.

තවද ගිණුම් හිමි සියළුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඔවුන්ගේ 60 වැනි උපන් දිනයේ දී හෝ ඉන්පසු එළැඹෙන එක් උපන් දිනයක දී ත්‍යාග පිරිනමනු ලැබේ. මීට අමතර ව සෙලාන් බැංකුව වාසනාවන්ත ගනුදෙනුකරුවන් 50 දෙනෙකුට තෙදින බැංකොක් සවාරියක් මාස 6 කට වරක් ලබා දෙයි.

රුපියල් 20,000 සිට 30,000 දක්වා, රුපියල් 30,001 සිට 60,000 දක්වා, රුපියල් 60,001 සිට 90,000 දක්වා, රුපියල් 90,001 සිට 150,000 දක්වා සහ රුපියල් 150,001 ට වැඩි කාණ්ඩ යටතේ ගිණුම් ශේෂ නිතිපතා පවත්වා ගෙන යන ගිණුම් හිමියන් ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබති. සෑම රුපියල් 20,000 කටම ගනුදෙනුකරුවන්ට බැංකොක් සවාරි දිනුම් ඇදීමකට එක් අවස්ථාවක් සැලසෙන අතර වැඩිවන  සෑම රුපියල් 20,000 ට දිනුම් ඇදීමට අමතර වාරයක් බැගින් හිමිවේ.

සෙලාන් බැංකුවේ අලෙවි අංශය බාර සහකාර සාමාන්‍යාධිකාරී කමල් දේශප්‍රිය මහතා අදහස් දක්වමින් "සුහද හදක් ඇති දේශීය බැංකුව වශයෙන් මෙවැනි ක්‍රමයක් හඳුන්වා දීමට ලැබීම ගැන අප සාඩම්බර වෙනවා. මෙවැනි ක්‍රමයක් හඳුන්වා දීම තුළින් පොදු ජනතාවගේ හද ගැස්ම පිළිබඳ අපට හැඟීමක් ඇති වෙනවා පමණක් නොවෙයි  ශ්‍රී ලංකාවේ මහ ජනතාවගේ අපේක්ෂාවන් අනුව අප කටයුතු කිරීමක් එමගින් සිදු වෙනවා. සෙලාන් ෂුවර් ත්‍යාග ක්‍රමය දියත් කිරීම ශ්‍රී ලංකාවේ මහජනතාවට හැම විටම නව්‍ය ගිණුම් සහ ප්‍රතිලාභ ක්‍රම හා සේවා හඳුන්වා දීමට උත්සාහ දරණ අප මහජනතාව වෙනුවෙන් කැපවී ක්‍රියා කිරීමේ තවත් ඉදිරි පියවරකි"

**Media Contact**
Kamal Deshapriya - AGM Marketing, Seylan Bank PLC. M: 077 381 51 33
Adahas PR – Kumar de Silva 0777 379 973. Tharindra de Silva 0777 560 611